## ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

**ප්‍රසම්පාදන අංකය S/309/26**

# කිඹුලාවල ශරීර සුවතා මධ්‍යස්ථානයේ ක්‍රියාවිරහිත ව්‍යායාම උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා යෝජනා කැඳවීම

Read Only

**යෝජනා කැඳවීම අවසන් කිරීම**

දිනය : **2026.XX.XX**

වේලාව : ප.ව. **01.30**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්)
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය
දුරකථන : 011-2866832

# <u>මාර්ග සිතියම සහ ස්ථාන සිතියම</u>

## <u>ස්ථානය - කිඹුලාවල</u>




**<u>යෝජනා පත්‍රිකාව සමඟ ලබාදිය යුතුම වන අත්‍යාවශ්‍යම ලිපිගොනු පරීක්ෂාව</u>**

- 06 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ අත්සන් කරන ලද යෝජනා පත්‍රය ☐
- 07 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ අත්සන් කරන ලද මිල අගයන් ඉදිරිපත් කිරීමේ පත්‍රිකාව ☐
- 8-10 පිටුවල සඳහන් දෝෂ විස්තර ප්‍රකාශනය ☐
- 11 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ සහතික කරන ලද දුස්සන්ධානීය නොවීම සහ බහු ලංසු/යෝජනා ඉදිරිපත් නොකිරීම සම්බන්ධ දිවුරුම් ප්‍රකාශය (Non-collusion Affidivit) ☐
- 3.4 වගන්තිය යටතේ ලංසු ඇපකරයෙහි මුල් පිටපත (පිටු අංක 03) ☐
- අදාල ව්‍යාපාර කෙෂ්ත්‍රය සම්බන්ධයෙන් වු ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය (පුද්ගලික සමාගමක් නම්, ව්‍යාපාරයේ ස්වභාවය තහවුරු කිරීමේ සහතිකයක්) ☐
- පුද්ගලික සමාගමක් වශයෙන් ලියාපදිංචි කර ඇති ව්‍යාපාරයක් නම්, ආකෘති අංක 18 සහ 20 ☐
- අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපත් ☐

## 1.0 <u>හැදින්වීම</u>

සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (මින් පසුව "සංස්ථාව" ලෙස හඳුන්වනු ලැබේ) විසින් කිඹුලාවල ශරීර සුවතා මධ්‍යස්ථානයේ ක්‍රියාවිරහිතව පවතින ව්‍යායාම උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා සුදුසුකම්ලත් පාර්ශවයන්ගෙන් යෝජනා කැඳවනු ලැබේ.

## 2.0 <u>යෝජකයින් සඳහා උපදෙස්</u>

2.1 අංක 1.0 සිට අංක 6.0 දක්වා වන ඡේද හොඳින් කියවා බලා අවබෝධ කර ගෙන තම යෝජනා ඉදිරිපත් කරන ලෙස යෝජකයින්හට උපදෙස් ලබා දෙයි.

2.2 යෝජනා සඳහා ඉල්ලුම් පත්‍රය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්) වෙතින් 2026/08/03 සිට 2026/08/18 දින දක්වා (වැඩකරන දින වලදී) පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා ආපසු නොගෙවන **රු 1,000/-** ගෙවා මිලදී ගත හැක.

2.3 වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා

සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන අංශය
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.
දුරකථන :- 011-2871167, 011-2799375, 070-4303310, 078-3766495, 070-1639095

2.4 මිල ගණන් ඉදිරිපත් කිරීමට නියමිත කාල සීමාවට ප්‍රථම ඕනෑම අවස්ථාවක ලිඛිතව හෝ ෆැක්ස් මාර්ගයෙන් අතිරේක ලේඛනයක් නිකුත් කිරීම මගින් යෝජනා සඳහා ඉල්ලුම් පත්‍රය සංශෝධනය කිරීමට සංස්ථාවට හැකියාව පවතී.

2.5 එක් යෝජකයෙක් එක් යෝජනාවක් පමණක් ඉදිරිපත් කළ යුතු අතර, එසේ එක් යෝජනාවකට වඩා ඉදිරිපත් කරන යෝජනා ප්‍රතික්ෂේප වනු ඇත.

2.6 යෝජකයෙක් තම යෝජනාව ඉදිරිපත් කිරීමට ප්‍රථම අදාල ව්‍යායාම උපකරණ පරීක්ෂා කිරීම සඳහා උපදෙස් ලබා දෙන අතර, එසේ පරීක්ෂා කිරීම සඳහා අදාල ස්ථානයට පැමිණීමේ පිරිවැය ඔහු විසින් දැරිය යුතුවේ.

2.7 යෝජකයෙක් තම යෝජනාව පිළියෙල කිරීම සඳහා දරණ පිරිවැය තමන් විසින්ම දැරිය යුතු අතර, මෙම සංස්ථාව එවැනි කිසිදු ආකාරයේ පිරිවැයක් දැරීමට යටත් නොවන අතර, එම පිරිවැය නැවත ගෙවීමක්ද සිදු නොකරයි.

## 3.0 <u>යෝජනා සඳහා ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීම</u>

3.1 යෝජකයන් විසින් ව්‍යායාම උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදී, යෝජනා සඳහා ඉල්ලුම් පත්‍රිකාවේ අත් අකුරින් සඳහන් කිරීමට ඇති සියළුම විස්තර සම්පූර්ණ කල යුතුයි.

3.2 යෝජනා ඉදිරිපත් කිරීම සඳහා පහත ලිපි ලේඛන සම්පූර්ණ කළ යුතුය.
මෙම ලේඛන අත්‍යාවශ්‍ය ලේඛන වන අතර, එම ලේඛන ලංසුව සමඟ ඉදිරිපත් නොකළහොත්, විශාල බැහැරවීමක් (Major Deviation) ලෙස සලකන අතර, එවිට ලංසුව ඇගයීමට භාජනය නොකොට ප්‍රතික්ෂේප කරනු ලැබේ.

Read Only

1. 06 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ අත්සන් කරන ලද යෝජනා පත්‍රය
2. 07 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ අත්සන් කරන ලද මිල අගයන් ඉදිරිපත් කිරීමේ පත්‍රිකාව
3. 8-10 පිටුවල සඳහන් දෝෂ විස්තර ප්‍රකාශනය
4. 11 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර සහ සහතික කරන ලද දුස්සන්ධානීය නොවීම සහ බහු ලංසු/යෝජනා ඉදිරිපත් නොකිරීම සම්බන්ධ දිවුරුම් ප්‍රකාශය (Non-collusion Affidivit)
5. 3.4 වගන්තිය යටතේ ලංසු ඇපකරයෙහි මුල් පිටපත (පිටු අංක 03)
6. අදාල ව්‍යාපාර කෙෂ්ත්‍රය සම්බන්ධයෙන් වූ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය (පුද්ගලික සමාගමක් නම්, ව්‍යාපාරයේ ස්වභාවය තහවුරු කිරීමේ සහතිකයක්)
7. පුද්ගලික සමාගමක් වශයෙන් ලියාපදිංචි කර ඇති ව්‍යාපාරයක් නම්, ආකෘති අංක 18 සහ 20
8. අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපත්

3.3 **<u>යෝජනාවෙහි වලංගුභාවය</u>**

යෝජකයා විසින් ඉදිරිපත් කරන යෝජනා **2026/10/07** දින දක්වා වලංගු විය යුතු අතර, අවශ්‍ය වන අවස්ථාවකදී මුල් යෝජනාවේ වලංගු කාල සීමාව දීර්ඝ කිරීම සඳහා යෝජකයා වෙත ඉල්ලීමක් සිදු කිරීමට සංස්ථාවට හැකියාව තිබේ.

3.4 **<u>ලංසු ඇපකරය</u>**

යෝජකයින් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවකින් ලබාගත් රු. **15,000/-** ක ලංසු ඇපකරයක් ලංසු පත්‍රිකාව සමග ලබාදිය යුතු අතර, ලංසු ඇපකරය **2026/11/04** දක්වා වලංගු විය යුතුය. (ආදර්ශ ආකෘතිය ඇමුණුම 02 දක්වා ඇත).

යෝජකයින් විසින් මුදලින් ඇපකර ඉදිරිපත් කරන්නේ නම් (චෙක්පත් සහ වෙනත් ආකාරයක ගෙවීම් ක්‍රම හැර) සංස්ථාවෙහි මුදල් අංශය වෙත ගෙවීම් සිදුකර ලබාගත් <u>ලදුපත යෝජකයින් විසින් ඉදිරිපත් කරන ව්‍යාපාර යෝජනාව සමඟ ඇමිණිය යුතුය.</u> චෙක්පත් හෝ වෙනත් ගෙවීම් භාරගනු නොලැබේ.

3.5 යෝජනා පත්‍රිකාවෙහි කරුණු පැහැදිලි කර ගැනීමට සහ අදාල ව්‍යායාම උපකරණ භෞතිකව පරීක්ෂා කිරීම සඳහා යෝජනාකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට **<u>2026/08/11 දින පෙ.ව.10.00ට</u>** කිඹුලාවල ශරීර සුවතා මධ්‍යස්ථානයේදී අවස්ථාව ලබා දේ.

එහිදී යෝජකයාට/යෝජකයින්ට යම් ගැටළුවක් වේ නම් එම ගැටළුව රැස්වීම පැවැත්වීමට නියමිත දිනට පෙර ලිඛිතව හෝ විද්‍යුත් තැපෑල මගින් ඉදිරිපත් කළ හැක. එසේ නොමැතිනම් එම රැස්වීමේදී විමසිය හැක.

අලුත්වැඩියාව සිදුකල යුතු ව්‍යායාම උපකරණවල අභ්‍යන්තරය පරීක්ෂා කර බැලීමට මෙම රැස්වීම අවසානයේදී අවස්ථාව ලබා දෙනු ඇත.

3.6 පිටු අංක 06හි ප්‍රමාණ බිල්පතෙහි සඳහන් එක් එක් අයිතමය සඳහා මිල අගයන් සඳහන් කල යුතුය. එම මිල අගයන් ඇතුලත පහත සඳහන් පිරිවැය සංඝටකයන් ඇතුලත්ව යන්ත්‍රය පරීක්ෂා කිරීම (කොටස් කිරීම හා නැවත එකලස් කිරීම ඇතුලුව), දෝෂ හඳුනා ගැනීම, අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් සහ සේවා සැපයීම, සවි කිරීම, යන්ත්‍ර ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සහ අලුත්වැඩියා කරන ලද යන්ත්‍ර සඳහා වගකීම් කාලය ලබා දීම යනාදී සියලුම මිල ඇතුලත් විය යුතුය.

**4.0 <u>යෝජනා ඉදිරිපත් කිරීම</u>**

4.1 යෝජකයින් තම යෝජනාව සමඟ ඉල්ලා ඇති අනෙකුත් ලේඛන, මුද්‍රා තබන ලද එක් ලියුම් කවරයක් තුල ඉදිරිපත් කල යුතුය (One envelope).

Read Only

4.2 ලංසු ඇපකරය මුදලින් ගෙවීම සිදුකරයි නම් එම රිසිට්පත හෝ බැංකු ඇපකරයෙහි **මුල් පිටපත** ලංසු පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය.

4.3 ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරෙහි "**ප්‍රසම්පාදන අංක S/309/26**" සහ "**කිඹුලාවල ශරීර සුවතා මධ්‍යස්ථානයේ ක්‍රියාවිරහිත ව්‍යායාම උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා යෝජනා කැඳවීම**" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

4.4 යෝජනාව බහා ඇති ලියුම් කවරයේ පහත ලිපිනය සඳහන් කළ යුතුය.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**වැලිකඩ, රාජගිරිය**

යෝජනාව ඉහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීම හෝ පහත ලිපිනයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

**සැපයුම් අංශය,**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**වැලිකඩ, රාජගිරිය**

4.5 යෝජනා පත්‍රිකා භාරගැනීම **2026/08/19** දින **ප.ව. 01.30** ට අවසන් වීමට නියමිත වන අතර එම වේලාව ඉක්මවූ වහාම සියළුම යෝජනා විවෘත කරනු ලැබේ. සංස්ථාවේ අභිමතය පරිදි අවශ්‍ය නම් අදාල දිනය දීර්ඝ කළ හැක.

4.6 යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සපයා ඇති අවසන් දිනට සහ වේලාවට පසුව ඉදිරිපත් වන යෝජනා ප්‍රතික්ෂේප වන අතර, එම යෝජනා යෝජනාකරු වෙත ආපසු යවනු ලැබේ.

4.7 යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් පසුව එම යෝජනාව වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට කිසිදු යෝජනාකරුවෙකුට අවසර හිමි නොවනු ඇත. යෝජනාව භාරදීමෙන් අනතුරුව යෝජනාවල වලංගු කාල සීමාව තුල කිසියම් යෝජනාකරුවෙකු විසින් තම යෝජනාව ඉවත් කර ගන්නේ නම්, 3.4 හි සඳහන් අදාල ලංසු ඇපකරය සංස්ථා සන්තක වේ.

## 5.0 යෝජනා විවෘත කිරීම සහ ඇගයීම

5.1 යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ලබාදී තිබූ අවසන් දින එම වේලාව ඉක්මවූ වහාම ලැබී ඇති යෝජනා විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට පැමිණ සිටින යෝජනාකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් පැමිණීමේ ලේඛණය අත්සන් කිරීම මගින් ඔවුන්ගේ පැමිණීම තහවුරු කළ යුතුය.

5.2 යෝජනාකරුගේ නම, ඉදිරිපත් කර ඇති අගය, ලංසු ඇපකරය සහ අවශ්‍ය අනෙකුත් තොරතුරු එම අවස්ථාවේදී ප්‍රකාශ කරනු ඇත.

5.3 යෝජනාව සඳහා අගය ප්‍රමාණ බිල්පතෙහි ඉලක්කමෙන් සහ අකුරෙන් ලිවීම අනිවාර්යය වන අතර, ගැටළු සහගත තත්ත්වයකදී අකුරින් සඳහන් අගය බලපවත්වන්නේය.

5.4 යෝජනාකරුවන් විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පරීක්ෂා කිරීම, යෝජනා සැසඳීම හා ඇගයීම සම්බන්ධ තොරතුරු පැහැදිලි කිරීම, කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ඉදිරිපත් කර නිර්දේශ යනාදිය යෝජනාකරු වෙත අනාවරණය නොකරනු ඇත. යෝජනා කැඳවීම හා ඒ සම්බන්ධ තීරණ ගැනීමේ සංස්ථාවේ ක්‍රියාවලියට බලපෑම් කිරීම සඳහා යෝජනාකරු විසින් දරණ ඕනෑම ප්‍රයත්නයක්, එම යෝජනාකරු විසින් ලබාදී ඇති යෝජනාව ප්‍රතික්ෂේප වීමට හේතු වේ.



Read Only

## 6.0 කොන්ත්‍රාත්තුව ප්‍රදානය හා අලුත්වැඩියා කටයුතු ආරම්භය

6.1 ඉදිරිපත් කර ඇති යෝජනාවල වලංගු භාවය ඉකුත් වීමට ප්‍රථම සංස්ථාව විසින් තෝරාගත් යෝජනාකරු වෙත ඔහුගේ යෝජනාව පිළිගත් බව සඳහන් කරමින් "කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමේ ලිපිය" ලියාපදිංචි තැපැල් මගින් යොමු කරනු ඇත. මෙම "කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමේ ලිපිය" නිත්‍යානුකූල ලේඛනය හෙවත් ගිවිසුම ලෙස පිළිගනු ලබන්නේ ය.

6.2 පිටු අංක 6හි සඳහන් අයිතමයන් සියල්ලම එක් යෝජකයෙක්ට හෝ යෝජකයන් කිහිප දෙනෙකුට වෙන් වෙන් වශයෙන් ප්‍රදානය කිරීමට සංස්ථාවට බලය තිබේ.

6.3 "කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ලිපිය" ලැබීමෙන් දින 14 ක් ඇතුලත තෝරාගත් යෝජනාකරු කොන්ත්‍රාත්තුව ප්‍රදානය පිළිගත් බවට ලිඛිතව සංස්ථාව වෙත දැන්විය යුතුය. තෝරාගත් යෝජකයාට ප්‍රදානය කෙරෙන අයිතමය/අයිතම අනුව ගලපාගන්නා කොන්ත්‍රාත් වටිනාකමින් 10%ක ප්‍රමාණයක් කාර්යසාධන ඇපකරය (Performance Bond) ලෙස සංස්ථාව වෙත තැන්පත් කල යුතුය.

6.4 "කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ලිපිය" ලැබීමෙන් දින 14 ක් ඇතුලත තෝරාගත් යෝජනාකරු විසින් ව්‍යායාම උපකරණ අලුත්වැඩියා කටයුතුද ආරම්භ කළ යුතුය. එසේ දින 14 ක් ඇතුලත අලුත්වැඩියා කටයුතු ආරම්භ නොකළහොත්, මෙම කොන්ත්‍රාත්තුව හා සම්බන්ධව උනන්දුවක් නොමැති බව සලකා වෙනත් යෝජනාකරුවෙකු තෝරා ගැනීම හෝ නැවත යෝජනා කැඳවීමක් සිදු කිරීමට සංස්ථාව විසින් කටයුතු කරනු ලැබේ. එවිට අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට අපොහොසත් වන එම තෝරාගත් යෝජනාකරුගේ ලංසු ඇපකරය සංස්ථාව සතු වේ.

6.5 කොන්ත්‍රාත් කාලය මාස 03ක් වන අතර, එම කාල සීමාව ඇතුලත අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් සහ සේවා සැපයීම, සවි කිරීම සහ යන්ත්‍ර ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම යනාදී සියලුම කාර්යයන් අවසන් කල යුතුය.

6.6 අලුත්වැඩියා කරන ලද යන්ත්‍ර සංස්ථාව වෙත භාර දුන් දිනයේ සිට "දෝෂ වගකීම් කාලය" ආරම්භ වන අතර, එය එතැන් සිට මාස දොලහක් (12)ක් දක්වා බල පැවැත්වේ. හඳුනාගනු ලබන සියලුම දෝෂ, තෝරගත් යෝජනාකරු විසින් අලුත්වැඩියා කර නිසි ක්‍රියාකාරී තත්ත්වයට පත්කල යුතු අතර, මෙම දෝෂ වගකීම් කාලය තුලදී අලුත්වැඩියා කරන ලද යන්ත්‍රයන්හි කිසියම් දෝෂයක් නැවත වතාවක් ඇතිවේ නම්, තෝරාගත් යෝජනාකරු විසින් ඔහුගේ වියදමින් නැවත අලුත්වැඩියාව සිදුකල යුතුය. මෙම දෝෂ වගකීම් කාලය අවසන් වන විටදී අලුත්වැඩියා කරන ලද යන්ත්‍ර දෝෂ විරහිතව, නිසි පරිදි ක්‍රියා කරන්නේනම් පමණක් කාර්යසාධන ඇපකරය නිදහස් කරනු ලැබේ.

6.7 අලුත්වැඩියා කටයුතු අවසානයේ යන්ත්‍ර සංස්ථාව වෙත භාර දීමෙන් පසුව කොන්ත්‍රාත් වටිනාකමින් 90% ක් එම අවස්ථාවේදී යෝජකයාට අයදුම් කල හැකි අතර, ඉතිරි 10%ක ප්‍රමාණය නිදහස් කරනු ලබන්නේ දෝෂ වගකීම් කාලය අවසන් වූ පසුව වේ. එම මුදල නිදහස් කිරීමේදීද, 6.6හි සඳහන් කල කොන්දේසි බල පැවැත්වේ.

6.8 කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ප්‍රථම ඕනෑම අවස්ථාවකදී ඕනෑම යෝජනාවක් හෝ සියළුම යෝජනා ප්‍රතික්ෂේප කිරීමට හෝ අදාල යෝජනා කැඳවීමේ ක්‍රියාවලිය අවලංගු කිරීමට සංස්ථාව සතුව බලය පවතින අතර, එහිදී එම ක්‍රියාව පිළිබඳව විමසීමට යෝජනාකරුවන්ට අයිතියක් නොමැත.

6.9 තෝරාගත් යෝජනාකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසුව හෝ යෝජනාවෙහි වලංගු කාලය ඉකුත් වීමෙන් පසුව යෝජනාකරුවන්ගේ ලංසු ඇපකර නිදහස් කරනු ලැබේ.

# <u>යෝජනා පත්‍රය</u>

**කිඹුලාවල ශරීර සුවතා මධ්‍යස්ථානයේ ක්‍රියාවිරහිත ව්‍යායාම උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා යෝජනා කැඳවීම**

සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,
අංක 03,
ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ,
රාජගිරිය.

කිඹුලාවල ශරීර සුවතා මධ්‍යස්ථානයේ ක්‍රියාවිරහිත ව්‍යායාම උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා සපයා ඇති විෂය කාර්යපථය සහ පිරිවිතරයන් පරීක්ෂා කල අතර, මෙහි යටින් අත්සන් තබන මම/අපි, නියමිත කොන්දේසිවලට අනුකූලව අදාළ අලුත්වැඩියා කටයුතු පහත සඳහන් මුදලට ඉටු කිරීමට මෙයින් ඉදිරිපත් වෙමු:

මුලු වටිනාකම: රු. ............................ + බදු
මුලු වටිනාකම (අකුරින්): රු. ..................................................................................................................
.......................................................................................................................................................... + බදු

මෙම යෝජනා පත්‍රයට අත්සන් තබන ලෙස නීත්‍යානුකූලව බලය පවරන ලද, ............................................................................ වෙනුවෙන් හා එම නාමයෙන්, ....................... වර්ෂයේ ................. මස ................. වැනි දින මෙම ලේඛනයට අත්සන් තබන ලදී.

අත්සන: ...................................................

නම: ........................................................

තනතුර: ...................................................

ලිපිනය:
.............................................................................................................................................................
.............................................................................................................................................................

සාක්ෂිකරු: ...................................................

Read Only

# මිල අගයන් ඉදිරිපත් කිරීම

## කිඹුලාවල ශරීර සුවතා මධ්‍යස්ථානයේ ක්‍රියාවිරහිත ව්‍යායාම උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා යෝජනා කැඳවීම

**සටහන**: පහත මිල අගයන් සඳහා යන්ත්‍රය පරීක්ෂා කිරීම (කොටස් කිරීම හා නැවත එකලස් කිරීම ඇතුලුව), දෝෂ හඳුනා ගැනීම, අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් සහ සේවා සැපයීම, සවි කිරීම, යන්ත්‍ර ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සහ අලුත්වැඩියා කරන ලද යන්ත්‍ර සඳහා මාස 12ක දෝෂ වගකීම් කාලය ලබා දීම යනාදී සියලුම මිල ඇතුලත් විය යුතුය.

| අයිතම අංකය | විස්තරය | මිල අගය (රු) (VAT රහිත) |
|---|---|---|
| 01 | Treadmill යන්ත්‍ර අංක 01 අලුත්වැඩියා කිරීම | |
| 02 | Treadmill යන්ත්‍ර අංක 02 අලුත්වැඩියා කිරීම | |
| 03 | Recumbent යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | |
| | **එකතුව (a)** | |
| | **එකතු** VAT 18% | |
| | **මුළු එකතුව** | |

එකතුව සඳහා (a) හි සඳහන් අගය **අකුරින්**

........................................................................................................................................... + VAT

- යෝජනාකරුගේ අත්සන :- ..................................................

  නම :- ..................................................

  ජා. හැ. අංකය :- ..................................................

  ලිපිනය :- ..................................................

  Whatsapp පහසුකම් සහිත දුරකථන අංකය :- ..................................................

  ඊ- මේල් ලිපිනය :- ..................................................

- සාක්ෂි 01

  අත්සන :- ..................................................

  නම :- ..................................................

  ජා. හැ. අංකය:- ..................................................

  ලිපිනය:- ..................................................

- සාක්ෂි 02

  අත්සන:-..............................................

  නම:- ..................................................

  ජා. හැ. අංකය:- ..............................

  ලිපිනය:- ..........................................

Read Only

# දෝෂ විස්තර ප්‍රකාශනය

| අයිතම අංක 01 - **Treadmill** යන්ත්‍ර අංක 01 අලුත්වැඩියා කිරීම | |
|---|---|
| **දෝෂ විස්තරය** | **අලුත්වැඩියා විස්තරය** |
| | |

- යෝජනාකරුගේ නම :- ……………………………………………..

  අත්සන :- ……………………………………………..

Read Only

| අයිතම අංක 02 - **Treadmill** යන්ත්‍ර අංක 02 අලුත්වැඩියා කිරීම | |
|---|---|
| **දෝෂ විස්තරය** | **අලුත්වැඩියා විස්තරය** |
| | |

- යෝජනාකරුගේ නම :- ……………………………………………..
  අත්සන :- ……………………………………………..

Read Only

| අයිතම අංක 03 - **Recumbent** යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | |
|---|---|
| **දෝෂ විස්තරය** | **අලුත්වැඩියා විස්තරය** |
| | |

- යෝජනාකරුගේ නම :- ……………………………………………..
  අත්සන :- ……………………………………………..

Read Only

**Annexure 1**

<u>දුස්සන්ධාන ගත නොවූ බවට වන දිවුරුම් ප්‍රකාශය (ආකෘතිය)</u>

<u>(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව -1.5)</u>

..............................යන ලිපිනයේ ලියාපදිංචි ව්‍යාපාරික ස්ථානය පිහිටි සහ .............. ලියාපදිංචි අංක දරණ .............................. තනි පුද්ගල ව්‍යාපාරයෙහි/සමාගමෙහි .............................. වන මා (ජා.හැ අංක .................... දරණ) පහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවට අවංකව හා ගාම්භීරතා පූර්වකව ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටියි.

01. ඔහු/ඇය නියෝජනය කරන ආයතනයේ, සමාගමේ, සංස්ථාවේ හෝ හවුල් ව්‍යාපාරයේ වෙනත් යම් සාමාජිකයකු, නියෝජිතයකු හෝ ඒජන්තවරයකු විසින්, ඔහු/ඇය, ලංසු තැබීමට නියමිත මිල සම්බන්ධයෙන් යම් පුද්ගලයකු සමග කිසියම් සංයෝජනයකට, හවුලකට හෝ ඒ හා සමාන ගිවිසුමකට එළඹ නොමැති බවත්,

02. ඔහු/ඇය හෝ ඔහු/ඇය නියෝජනය කරන යම් තැනැත්තකු විසින් යම් ලංසුකරුවකු ලංසු තැබීමෙන් වැළැක්වීමට හෝ ලංසු තැබීමෙන් වැළකී සිටීමට කිසිවකු පොළඹවා ගැනීමට කිසිදු පියවරක් ගෙන නොමැති බවත්; සහ

03. මෙම ලංසුව, වෙනත් කිසිදු ලංසුවක තොරතුරු විමසීමෙන් තොරව සකසා ඇති බවත්, මෙම ලංසුව සම්බන්ධයෙන් වෙනත් යම් තැනැත්තකු සමග යම් ගිවිසුමකට, එකගතාවයකට හෝ යම් සංයෝජනයකට එළඹ නොමැති බවත්;

04. මෙම ලංසුව ඉදිරිපත් කිරිමට අදාළව කිසිදු පුද්ගලයකුට, සමාගමකට හෝ සංස්ථාවකට ඍජුව හෝ වක්‍රව කිසිදු වට්ටමක්, ගාස්තුවක්, ත්‍යාගයක්, කොමිස් මුදලක් හෝ වෙනත් වටිනා ද්‍රව්‍යයක් ලැබී නොමැති බවත් එවැන්නක් නොලැබෙන බවත් ඔහු/ඇය වැඩි දුරටත් ප්‍රකාශ කර සිටි.

05. වෙනත් එවැනි ගිවිසුමකට එළඹ නොමැති බවට ලංසුකරු වගකීම් සහගතව ප්‍රකාශ කර සිටින අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය පුරාවට සාධාරණ හා සදාචාරාත්මක තරග පිළිවෙත් වලට අනුගත වන බවටත් අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පූර්ණ වශයෙන් අනුකූල වන බවටත් මෙයින් ප්‍රතිඥා දෙයි.

මෙම දිවුරුම් ප්‍රකාශයේ මා විසින් ඉදිරිපත් කර ඇති සියලු ම ප්‍රකාශ සත්‍ය හා නිවැරදි බවත්, බොරු සාක්ෂි දීමෙන් ඇති විය හැකි ප්‍රතිඵල පිළිබඳව දැනුවත් බවත් මම මෙයින් සහතික කරමි.

ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශය එකී ප්‍රකාශක හට
මා විසින් කියවා පැහැදිලි කර දුන් බවත් ඔහු/ඇය
එහි සඳහන් කරුණු අවබෝධ කර ගත් බවත්
එකී කරුණු නිවැරදි බවට පිළිගෙන....................
දින ..........මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් ප්‍රකාශ කරමි.

මා ඉදිරිපිට දී ය.

සාමදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්

**Annexure 2**

# SPECIMEN FORM OF PROPOSAL SECURITY

…………………………………..
…………………………………..
…………………………………..
(Name & Address of Guarantor)

**Beneficiary;**
General Manager,
Sri Lanka Land Development Corporation,
No 03,
Sri Jayawardenapura Mawatha,
Rajagiriya.

Whereas, .................................................................. (name of Proponent) (hereinafter called and referred to as '' the Proponent ''), has submitted its Proposal dated ...................... (date) for the "Repairing of the Gym Equipment at the Gymnasium at Kimbulawala" (hereinafter called and referred to as '' the Proposal'').

KNOW ALL PEOPLE by these presents that WE.................................................... (name of organization) having our registered office at ............................................ (hereinafter called and referred to as ''the Guarantor''), are bound unto "General Manager, Sri Lanka Land Development Corporation, No 03, Sri Jayawardenapura Mawatha, Rajagiriya" (hereinafter called and referred to ''the Employer'') in the sum of Sri Lanka Rupees 15,000.00 for which payment well and truly to be made to the said Employer. The Guarantor binds itself, its successors, and assignees by these presents.

SEALED with the Common Seal of the said Guarantor this ........................... day of ............................

We undertake to pay the Employer unconditionally up to the above amount upon receipt of its first written demand, without the Employer having to substantiate its demand provided that in its demand the Employer will note that the amount claimed by it is due to it, specifying the occurred condition or conditions.

This Guarantee will remain in force up to ………………… and any demand in respect thereof shall be received by us no later than the above date.

DATE ................................ SIGNATURE OF THE GUARANTOR...........................................
WITNESS............................ SEAL

(Signature, Name and Address)

Read Only